# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,331 — 1937ක්වූ නොවැම්බර් මස 19 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඩකනිති.

වර්ෂ 1901යේ බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනත.

වර්ෂ 1901යේ බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ 5 පස්වෙනි වගන්තිය යටතේ ඒ සඳහා නියම බලයලත් නිලධාරිතැන විසින් එනම්, මඩකලපු නාගරික පලාත්ආණ්ඩු සභාවේ සභාපතිතැන විසින් මඩකලපු පලාත් පාලක ආණ්ඩු සභාවේ පාලනචක්‍ර සීමාතුල ප්‍රදේශය සඳහා සාදනලද උපනීති.

ඇම්. චින්නයියා,
සභාපතිතැන.

වර 1937ක්වූ නොවැම්බර් මස 9වෙනි දින මඩකලපු නාගරික පලාතේ ආණ්ඩුසභා කන්තෝරුවේදීය.

### උපනීති.

1. මෙම උපනීතිවල :—

"සභාපති" යන්නෙන් දක්වන්නේ මඩකලපු නාගරික පලාත් ආණ්ඩුසභාවේ සභාපතිතැනය.

"අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව" යන්නෙන් දක්වන්නේ ආඥාපනතේ 5 පස්වෙනි වගන්තිය යටතේ අයකරණ අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුවයි.

බල්ලෙකුගේ "අයිතිකාරයා" යන්නෙන් දක්වන්නේ එකී බල්ලාගේ අයිතිකම හෝ භාරය ඇති තැනැත්තාය.

2. මඩකලපු නාගරික පලාත් ආණ්ඩුසභා ආඥාචක්‍රයෙහි සීමාතුල සිටින එක එක බල්ලා වෙනුවෙන් ගෙවන අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව මෙහි පහත දක්වනාකාර වන්නේය:—

බල්ලන්ගේ පිරිමි සතෙකුට රු. 1 0
බල්ලන්ගේ ගැණු සතෙකුට රු. 1 50

3. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව යම් අවුරුද්දක් සඳහා ගෙවියයුතුවේද ඒ අවුරුද්දේ මැයි මාසයේ 1වෙනි දිනට ඔත්තෙන් බල්ලන්ගේ අයිතිකාරයා විසින් ගෙවිය යුතුයි.

4. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව ගෙවන්ට පෙනුනවිට සභාපතිතැන විසින් බල්ලන්ගේ අයිතිකාරයාට—

(i.) ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් සහ,

(ii.) සහතිකපත්‍රයේ අංකය එහි මුද්‍රිත ලෝහමය තහඩුවක් හෝ කර පටියක් නිකුත්කරනු ලැබේ.

එසේද වුවත් යම්කිසි බල්ලෙකුගේ ලියාපදිංචිකිරීම සඳහා යම් ඉල්ලීමක්කරන ලද්දේද එකී බල්ලා ගෙනත් පෙන්වා සිටින්ට නියමකිරීමට සභාපතිතැනට පුළුවන්කම තිබේ, කවද—

(*a*) එකී බල්ලා ගෙනත් පෙන්වා නොසිටියහොත්; නැතහොත්,

(*b*) එකී බල්ලා සභාපතිතැනගේ කල්පනාවේ හැටියට ජීවත්වීමට නුසුදුසු තරම් අංගහීනකරණ ලදුව හෝ ලෙඩ සහිතව සිටීනම්, නැතහොත්

(*c*) එකී බල්ලා උගේ අයිතිකාරයා විසින් නිරන්තරයෙන් සාරකම් හෝ නොසැලකිලිකම් කරනුලබන්නේ වේද,

එවිට එකී බල්ලාට ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් සහ ලෝහමය තහඩුවක් හෝ කරපටියක් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමට සභාපතිතැනට පුළුවන්වේ.

5. ලියාපදිංචිකිරීමේ යම්කිසි සහතිකපත්‍රයක් නිකුත් කරණ ලද්දාවූ යම්කිසි බල්ලෙකුගේ අයිතිකාරයාට ලියුම් ලැබෙන ස්ථානයෙහි දැන්වීමක් තැබූවාට පසු—

(*a*) එකී බල්ලා සභාපතිතැනගේ කල්පනාවේ හැටියට ජීවත්වීමට නුසුදුසු තරම් අංගහීනකරණලදුව හෝ ලෙඩ සහිතව සිටීනම්, නැතහොත්

(*b*) එකී බල්ලා උගේ අයිතිකාරයා විසින් නිරන්තරයෙන් සාරකම් හෝ නොසැලකිලිකම් කරණු ලබන්නේ වේද, නැතහොත්

(*c*) උගේ අයිතිකාරයා විසින් එකී බල්ලාට පැතිරීයන්නාවූ හෝ බෝවෙන්නාවූ යම් කිසි රෝගයකින් ලෙඩ පෙළෙමින් සිටින කාලෙක වෙන යම්කිසි බල්ලෙකු සමග ඇශ්‍රයකිරීමට ඉඩහරීනම්,

එබඳු සහතිකපත්‍රය අවලංගුකිරීමට සභාපතිතැනට පුළුවන්වේ.

6. 4වෙනි උපනීතිය යටතේ ලියාපදිංචිකිරීමේ සහතික පත්‍රයක් ප්‍රතික්ෂේපකරණ ලද්දාවූ හෝ 5වෙනි උපනීතිය යටතේ එය අවලංගුකරණ ලද්දාවූ යම්කිසි බල්ලෙකුගේ අයිතිකාරයා විසින් ඒ සඳහා දැන්වීමක් සභාපතිතැන විසින් කරා වෙන එවිට සභාපතිතැන විසින් නියමකරණ ලද්දාවූද දැන්වීමේ විස්තරකරණ ලද්දාවූද වේලාවක හා ස්ථානයක එකී බල්ලා ගෙනත් පෙන්වා සිටිය යුතුයි.

(2) එබඳු නැමබල්ලාම සභාපතිතැනට සුදුසුය කියා කල්පනා වෙන හැටියට විනාශකර ඉකුත්කර දැමිය හැකිවේ.

7. ලෝහමය තහඩුවක් හෝ කරපටියක් නිකුත්කරණ ලද්දාවූ යම්කිසි බල්ලෙකුගේ අයිතිකාරයා විසින් එකී බල්ලා වෙනුවෙන් නිකුත්කරණලද ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය බල පවතින කාලයතුළ ලෝහමය තහඩුව හෝ කරපටිය එකී බල්ලාගේ බෙල්ලවටේ සෑම වේලේම ප්‍රවේසම් සහිතව බැඳ තිබෙන ලෙස එය බලාගැනීමට සියළුම උවමනා විධිවිධාන සැලැස්විය යුතුවේ.

8. මේ උපනීතිවලින් සභාපතිතැන වෙත පැවරී තිබෙන බලපූර්වක්කම්වලින් යම්කිසි එකක් හෝ සියල්ලම බල පැවැත්වීමට යම්කිසිවෙකුට ලියවිල්ලකින් බලයදීමට සභාපතිතැනට පුළුවන්වේ.

9. වර්ෂ 1903ක්වූ ජනවාරි මස 9වෙනි දින නො. 5,899 දරන හා වර්ෂ 1911වේ අප්‍රේල් මස 21වෙනි දින නො. 6,437 දරණ ගැසැට් පත්‍රවල ප්‍රසිඩකරන්ට යෙදුනාවූද ප්‍රදේශිය ආණ්ඩුව පිළිබඳ 1920 වේ නො. 11 දරණ ආඥාපණතේ 247වෙනි වගන්තියේ සම්පාදනයන් අනුව බල පවත්වමින් තිබෙන මඩකලපුවේ ප්‍රදේශීය සභාවේ උපනීති මෙයින් අවලංගුකරණලදී.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

### 1931වේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,647 (කෑගල්ල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 19වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931වේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 7වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. අලුවිහාරෙ,
කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත විස්තර පෙනෙන සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කේ බෙලිගල්කෝරළේ දකුණ කඩුපිටිපත්තුවේ පුස්පගේ යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටි, එනම්:—

මුල් සිතියමේ නො. A 99.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 1 | නෙදඹනේමූකලාන .. .. | 5 | 3 | 29 |
| 2 | එම .. .. | 4 | 3 | 22 |
| 3 | එම .. .. | 1 | 0 | 38 |
| | | 12 | 0 | 9 |

මීට මායිම්—උතුරට, නැගෙණහිරට සහ දකුණට උඩුගොඩ ගම්මායිම; බස්නාහිරට පුස්වෙහෙහේනඇල, ඩී. රතා අයිතිකම්කියන පහලකොස්වත්තේහේන, ජී. අප්පුහාමි අයිතිකම් කියන පහලකොස්වත්තේහේන, ඩී. රතා සහ සිඤ්ඤා අයිතිකම්කියන කොස්වත්තේහේන සහ ඩී. රතා සහ සිඤ්ඤා අයිතිකම්කියන මැල්ලගල්හේන.

---

### 1931වේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,648 (කෑගල්ල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 19වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931වේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. අලුවිහාරෙ,
කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිය.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත විස්තර පෙනෙන සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කේ ගල්බොඩකෝරළේ ගල්බොඩපත්තුවේ බඳුලුපිටිය යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටි, එනම්:—

මුල් සිතියමේ නො. පී. පී. 4,002.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 1 | ගෙදරකැලේහේන නොහොත් නත්තාරන් වැලගාවාහේන .. .. | 0 | 0 | 31 |
| 2 | එම .. .. | 0 | 3 | 8 |
| 3 | එම .. .. | 0 | 1 | 31 |
| 4 | ගෙදරකැලේහේන නොහොත් උඩගෙදර හේන .. .. | 0 | 1 | 36 |
| 5 | එම එම ගල්බොක්කේහේන .. | 0 | 2 | 28 |
| 6 | එම එම කොහොල්පන්නලගේහේන .. | 0 | 1 | 2 |
| 7 | එම එම උඩගෙදරහේන .. | 0 | 2 | 22 |
| 8 | එම එම අළුත්වත්තේහේන .. | 0 | 0 | 37 |
| 9 | එම එම ගල්පොත්තේහේන .. | 1 | 1 | 21 |
| | | 5 | 0 | 16 |

මීට මායිම්—උතුරට ඒ අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කන්දවුල්ල; නැගෙණහිරට අල්කෙටගම ගම්මායිම (F. V. P. 176), ඒ. අප්පුහාමි විසින් අයිතිකම් කියන ගෙදරකැලේහේන නොහොත් උඩකොටුවෙහේන සහ ඒ අප්පුහාමි සහ තවත් අය අයිතිකම්කියන දිමියන්ගහමුලවත්ත; දකුණට ඒ. අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දිමියන්ගහමුලවත්ත; බස්නාහිරට ඒ. රංහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන රඹගහමුලවත්ත, ආණ්ඩුව සහ ඇම්. පුංචිරාල සහ තවත් අය විසින් අයිතිකම් කියන හේරත්ගේවත්ත (පී. පී. 4,002 දරණ මුල් සිතියමේ 10වෙනි බිම්කට්ටිය), ඇම්. මුනසිංහ විසින් අයිතිකම්කියන කන්දවුල්ලේවත්ත, ඇම්. මුනසිංහ විසින් අයිතිකම්කියන කටුගහයායේහේන සහ ආර්. පිංචෝ විසින් අයිතිකම්කියන මිලික්ගේකොටුව.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Puttalam No. 79.**—වයඹ දිසාවේ පුත්තලම සහ හලාවත දෙපලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩු සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1938ක්වූ ජනවාරි මස 14වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට පුත්තලම් කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුකරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ පුත්තලම් පලාතේ පුත්තලම්පත්තුව සහ කඩවත්සතර කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 5ක්.

මුල් සිතියමේ නො. 6,431. ගම—මහතැඹුකුලිය. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | | | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | හෙඹුකුලියේවත්ත .. | — | .. පොල් ඉඩම, නැසීගිය ජී. එච්. පෙරේරා අල්ලා වගාකරනලදී | 0 | 1 | 21 | 16·59* ඉඩම්කැබලි තුනටම |
| 2 | එම .. | — | .. එම .. .. | 0 | 0 | 26 | |
| 3 | එම .. | — | .. එම .. .. | 0 | 0 | 16 | |
| 16 | කරිසිකුලමේවත්ත .. | — | .. පොල් ඉඩම, නැසීගිය ජේ. ඩී. ලාසරස් අල්ලා වගාකර තිබේ | 0 | 1 | 23 | 5·91* මුළු ඉඩමට |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | | | මුල් සිතියමේ නො. A 292 ගම — දකුණු පුත්තලම. | | |
| 2 | අංතෝනිඅම්මාගේවත්ත | — | .. ඉසිකල් අංතෝනිපුල්ලේ අල්ලාගෙන සිටින ඉඩම | 0 0 1·02 | 2·0* මුඩු ඉඩමට |

* බේරුකිරීමට (නො. 380–386 දරන ඉඩම් පිළිබඳ රෙගුලාසි යටතේ).

මේ 1937ක්වූ නොවැම්බර් මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

වී. කුමාරස්වාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**Puttalam No. 80.**—වයඹ දිසාවේ පුත්තලම සහ හලාවත දෙපලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1938ක්වූ ජනවාරි මස 14වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට පුත්තලමේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අයුරකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ පුත්තලම් පලාතේ දෙමළහත්පත්තුව කොටසේ පිහිටා තිබෙන බිම් කැබලි 1ක්.

මුල් සිතියමේ නො. A 493. ගම—තෙන්නන්කුරියාව (පාලු) ආණ්ඩම්බුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|---|
| 2 | තෙන්නන්කුරියාමේවෙල | — | .. ආණ්ඩුව සහ හලාවත ජේ. සවරිමුත්තු | කුඹුර | .. 1 0 26 | 20·34* මුඩු ඉඩමට |

* නො. 380–386 දරන ඉඩම් පිළිබඳ රෙගුලාසි යටතේ බේරුම්කිරීමට.

මේ 1937ක්වූ නොවැම්බර් මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

වී. කුමාරස්වාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**Puttalam No. 81.**—වයඹ දිසාවේ පුත්තලම් සහ හලාවත දෙපලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1938ක්වූ ජනවාරි මස 19වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට හලාවත කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අයුරකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ හලාවත පලාතේ උතුරු පිටිගල්කෝරළේ කොටසේ පිහිටා තිබෙන බිම්කැබලි 30ක්.

මුල් සිතියමේ නො. 7,024. ගම—හැලඹවටවන. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 2 | තෙලුන්කුලිය .. | — | .. පොල්වත්ත, ජේ. එම්. පුංචිරාල විසින් අල්ලාගෙන තිබේ | 0 0 12 | 35* |
| | | | මුල් සිතියමේ නො. A 433. ගම—පහලම්සියාව. අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ ජී. සී. වීරසිංහ සහ තවත්. | | |
| 1 | තල්ගහගාල .. | — | .. පොල්වත්ත .. | .. 0 3 3 | 35* |
| | | | අයිතිකමකියන්නා — ආණ්ඩුව සහ ලම්ඵනා. | | |
| 2 | ගල්යායේවත්ත .. | — | .. පොල්වත්ත .. | .. 0 2 10 | 35* |
| | | | අයිතිකමකියන්නා — ආණ්ඩුව සහ එච්. එම්. බී. අප්පුහාමි. | | |
| 3 | පලුගහකුඹුර .. | — | .. කුඹුර .. .. | .. 2 0 22 | 10* |
| | | | අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ බබිලිච්. එම්. මැණික්හාමි. | | |
| 4 | මුදුකිරියල්කුඹුර .. | — | .. කුඹුර .. .. | .. 1 0 25 | 10* |
| | | | අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ සී. පිංහාමි සහ තවත්. | | |
| 5 | මුදුකිරියල්හේන .. | — | .. හේන .. .. | .. 3 1 34 | 35* |
| | | | අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ එස්. ඒ. හෙන්ද්‍රික් සිංඤෝ. | | |
| 6 | අඑත්කුඹුර .. | — | .. පරණකුඹුර .. | .. 2 2 12 | 35* |
| | | | අයිතිකමකියන්නා — ආණ්ඩුව සහ ඒ. ඒ. අප්පුහාමි. | | |
| 7 | එම .. | — | .. කුඹුර .. .. | .. 2 3 35 | 35* |
| | | | මුල් සිතියමේ නො. A 459. ගම—ආරච්චිකට්ටුව. අයිතිකමකියන්නා – ආණ්ඩුව. | | |
| 1 | පහලකුඹුරේහේන, පහල කුඹුර, පහලකුඹුරේවත්ත | — | .. හේන, කුඹුර, වත්ත, ඇම්. පී. ප්‍රනාන්දු විසින් අල්ලාගෙන තිබේ | 0 2 31 | 35* |
| 2 | පහලකුඹුර පහල කුඹුරේ වත්ත | — | .. කුඹුර සහ වත්ත, ඇම්. පී. ප්‍රනාන්දු විසින් අල්ලාගෙන තිබේ | 0 0 37 | 35* |
| 3 | දෙස්තරවත්ත .. | — | .. පොල්වත්ත, වීරපෙරුමාල් දෙස්තර මහත්මයා විසින් අල්ලාගෙන තිබේ | 5 1 7 | 35* |
| 4 | එම .. | .. | .. එම .. | .. 0 3 13 | 60* |
| 5 | මීනිපිට්ටනිය .. | — | .. සොහොන් භූමිය, නොවිකුණ ඉතිරිකිරීමට .. | 0 3 9 | —† |
| 6 | රනවත්ත .. | — | .. පොල්වත්ත, පාලවාසමුත්තු නාඩාර් විසින් අල්ලාගෙන තිබේ | 0 0 15 | 60* |
| | | | මුල් සිතියමේ නො. F. V. P. 70. ගම—පුලියන්කාර. | | |
| 54 | පුලියන්කාරවැව .. | — | .. වැව, නොවිකුණ ඉතිරිකිරීමට | .. 11 0 36 | —† |
| 55 | තිබිරිගහදෙනිය .. | — | .. වැවට ඉතිරිකිරීමට .. | .. 0 1 5 | —† |
| 56 | තිබිරිගහදෙනියේවත්ත | — | .. පොල්වත්ත, ජේ. තියාගරාජ් අල්ලාගෙන සිටිසි | 1 0 14 | 45* |
| 57 | තිබිරිගහදෙනිය .. | — | .. වැවට ඉතිරිකිරීමට .. | .. 0 0 20 | —† |
| 58 | එම .. | — | .. පාර ප්‍රවේසමට ඉතිරිකිරීමට | .. 0 0 12 | —† |
| | | | මුල් සිතියමේ නො. F. V. P. 683. ගම—තාඹරකුලම. | | |
| 6J | වැවගාවවත්ත .. | — | .. වත්ත, ඩී. එම්. පුංචිහාමි අල්ලාගෙන සිටිසි | .. 0 0 28 | 5·25* මුඩුඉඩමට |
| | | | මුල් සිතියමේ නො. 7,090. ගම—කිරියන්කල්ලි. | | |
| 8 | පනියවයල් .. | — | .. කුඹුර, මුත්තුසුප්පනියා පුල්ලේ සහ තවත් අයවළුන් විසින් අල්ලාගෙන තිබේ | 0 0 18 | 35* |
| 9 | කිරියන්කල්ලි වටුන්තෝට්ටම් | — | .. පොල්වත්ත, පුත්තලමේ A. L. ලෙව්වෙමහත් හෙට්ටියාර් විසින් අල්ලාගෙන තිබේ. | 0 0 13 | 10* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 13 | අක්කරවෙලි | — | කුඹුර, පුදුකුඹිරිප්පුවේ අබ්දුල් ලේබ් සහ තවත් අයවලුන් විසින් අල්ලාගන තිබේ | 0 3 37 | 10* |
| 27 | මාවිත්තෙබිල් එස්ටේට් | — | පොල්වත්ත, බත්තුලුඔයේ G. L. J. හෙන්රි පෙරේරා සහ තවත් කෙනෙක් විසින් අල්ලාගන තිබේ | 0 3 36 | 10* |
| 40 | හරකුඹිවිල්ලුවත්ත | — | පොල්වත්ත, මීගොමුවේ K. D. වික්ටර් විසින් අල්ලාගන තිබේ | 1 0 8 | 10* |
| 51 | හරකුඹිවිල්ලුතෝට්ටම් | — | පොල්වත්ත, උඩප්පුවේ මුත්තුරක්කු පුල්ලේ කාදිර්ගාමින් පුල්ලේ සහ තවත් අයවලුන් විසින් අල්ලාගන තිබේ | 0 1 8 | 10* |

මුල් සිතියමේ නො. A 499. ගම—නැලඹවවන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ගල්කුලියේවත්ත | — | පොල් ඉඩම, කොළඹ පී. මුත්තුකුමාරු අල්ලාගන සිටී | 0 0 13 | 110* |

මුල් සිතියමේ නො. A 500. ගම—හල්ලදරන්කට්ටුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ඉලක්කම්ටුවවත්ත | — | පොල්වත්තේ කොටසක්, එස්. එම්. ජේ. ප්‍රනාන්දු අල්ලාගන සිටී | 0 1 14 | 60* |
| 2 | ඉලක්කම්ටුවකැලේ | — | පාරකට ඉතිරිකිරීමට | 0 0 1 | —† |

මුල් සිතියමේ නො. A 503.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ඉලක්කම්ටුවවත්ත හෝ නොහොත් හෙලුන්කුලියේ වත්ත | — | පොල්වත්තේ කොටසක්, එස්. එම්. ජේ. ප්‍රනාන්දු අල්ලාගන සිටී | 0 0 12 | 60* |

* බේරුම්කරදීමට (නො. 380–386 දරණ ඉඩම් පිළිබඳ රෙගුලාසි යටතේ).

† නොවිකුණා ඉතිරිකිරීමට.

වම් 1937ක්වූ නොවැම්බර් මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

පී. කුමාරසවාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**Puttalam No. 82.**—වයඹ දිසාවේ පුත්තලම සහ හලාවත දෙපලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1938ක්වූ ජනවාරි මස 19වෙනි දිනවූ බදාදා පස්වරු 3ට මාරවිල හැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් නින්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ හලාවත පලාතේ දකුණු පිටිගල්කෝරලේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

මුල් සිතියමේ නො. 6,511. ගම—පහල විලහපිටිය. අයිතිකාරකියන්නා.—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 6 | මරදන්වැල්ලේවත්ත | — | පොල්ඉඩම, විජේසිංහ දෙස්තර මහත්මයා විසින් අල්ලාගන තිබේ | 1 0 25 | 50* |

මුල් සිතියමේ නො. A 240. ගම—බස්නාහිර කිරිමැටියාන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 4 | දෙල්ගහගොඩැල්ලේවත්ත | — | පොල්ඉඩම, ඩබ්ලිව්. එම්. ජ්. ද සිල්වා විසින් අල්ලාගන තිබේ | 0 0 32·6 | 5·86* මුලු ඉඩමට |
| 5 | කිරිමැටියානේමිත්ත | — | පොල් ඉඩම, ඇම්. ආර්. ආර්. ඇම්. ඇම්. ආර්. රම්සාමි සෙට්ටියාර් විසින් අල්ලාගන තිබේ | 0 0 10 | 2·97* මුලු ඉඩමට |

මුල් සිතියමේ නො. 4,812. ගම—හාල්දඹුවන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 16 | ඌරුකනුකැලේවත්ත | — | පොල්ඉඩම, එස්. ඒම්. එලායිස් ෆොන්සේකා හාමිනේ අල්ලාගන සිටිති | 0 0 25 | 1·56* මුලු ඉඩමට |

* නො. 380–386 දරන ඉඩම් පිළිබඳ රෙගුලාසි යටතේ බේරුම්කිරීමට.

වම් 1937ක්වූ නොවැම්බර් මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

පී. කුමාරසවාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 12,651, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1938ක්වූ ජනවාරි මස 20වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට බලංගොඩ උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් නින්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරලේ කොලඹපත්තුවේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 28ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 288. ගම—ඇල්ලෙපොල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 33AP | දෙහෙමෝදරහේන | (1) වලබද්දගේ කිරිබන්නා, (2) කිතගහඇහෙල්ගෙදර කිරිහත්නා විසින් හිසමුදල් ගෙවානැත | හේන සහ කුඹුර | 0 2 27 |
| 163Z | මාරගහමුලහේන | හල්පගේ දුවිත්සිඤ්ඤො විසින් හිසමුදල් ගෙවානැත | හේන | 0 1 11 |
| 196 | හල්කැටියේ ගොඩ හේන, හල්කොරටුව | (1) සින්නාලෙබ්බේ අබ්දුල්ලෙබ්බේ මරික්කාර්, (2) අබ්දුල්රහිමන්ලෙබ්බේ පාතුම්මා බීබී | එම | 2 0 11 |
| 196M | හල්ලිදේහේන | බලන්ගොඩ පදිංචි අබ්දුල්ලෙබ්බේ මරික්කාර් සහනා මරික්කාර් විසින් හිසමුදල් ගෙවානැත | එම | 0 3 4 |
| 196N | ඉලුක්වත්තේහේන | එම | එම | 0 1 1 |
| 223B | කොලොන්ගහමුලහේන | ආණ්ඩුව | එම | 1 0 12 |
| 223C | එම | එම | එම | 1 0 11 |
| 223D | ගුරුතලාකන්හේන | එම | එම | 1 0 11 |
| 223E | ගල්ගොඩහේන | (1) අමුනුකාදරවබුදුරගේ යශෝ, (2) ලිදවත්තේ ඉසෝ, (3) එම ජේම්සා, (4) එම මිරිහේනිස්, (5) ඇල්ලෙපොල පදිංචි හල්පගේ එන්දෙරිස් | එම | 0 3 20 |
| 223F | හල්කොබවත්ත | එම | වත්ත | 0 0 33 |
| 223P | අරලුගහමුලහේන | ආණ්ඩුව | හේන | 1 0 12 |
| 223Q | එම | එම | එම | 0 2 15 |
| 223R | එම | එම | එම | 1 0 4 |
| 223S | එම | එම | එම | 1 0 10 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | ඔහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 263c | — .. | (1) හල්පේගේ එන්සෙරිස්, (2) එම කිරිංපත්තා, (3) එම හරමානිස්, (4) එම සිරමී, (5) එම අගොස්තිනා, (6) ආර්නොලිස්, (7) හල්පේගේ මාවිත් | නාවකාලික ගොඩනැගිලි | 0 | 0 | 1* |
| 298 | බෝගහමුලවත්ත .. | (1) ඇල්ලෙපොල පදිංචි බලබද්දගේ කිරිසත්තා, (2) බෝරගැල පදිංචි එම බබී විසින් හිසමුදල් ගෙවානැත | වත්ත .. | 0 | 1 | 3 |
| 301c | කල්ලිංදේහේන, කල්ලිංදේ හේනේපතන | අබ්දුල්ලෙබ්බෙ මරික්කාර් හසනා මරික්කාර් විසින් හිසමුදල් ගෙවානැත | හේනසහපතන | 4 | 0 | 14 |
| 319 | දිග්කඹුරේහේන, දිග්කඹුරේ වත්ත, ඇල්ලගාවඅරාවේ ගොඩහේන | (1) බලංගොඩ පදිංචි ඇග්නස් ඇලන් ජින්ජර්, (2) ලෝරන්ස්ද සිල්වා විසින් හිසමුදල් ගෙවානැත | තේ .. | 6 | 3 | 37 |
| 339ɪ | මැදහිත්තේහේන .. | බලංගොඩ පදිංචි මහබදුගේ හරමානිස් ප්‍රනාන්දු .. | හේන .. | 1 | 2 | 12 |
| 341 | එම .. | බලංගොඩ පදිංචි මහබදුගේ හරමානිස් ප්‍රනාන්දු විසින් හිසමුදල් ගෙවානැත | එම .. | 2 | 2 | 8 |
| 346 | කරඹුකැටියේවත්ත .. | බිලාත්වි මැනෝන් කැරන් විසින් හිසමුදල් ගෙවානැත (මීගමුවේ වී. පී. සී. කැරන් පෙරකදෝරුනැන බාරේ) | තේ .. | 2 | 1 | 8 |
| 348 | පිලගහවත්ත .. | බලන්ගොඩ පදිංචි ඇග්නස් ඇලන් ජින්ජර් .. | එම .. | 8 | 2 | 8 |
| 349 | පුංචිකුඹුරේ තරංබිහේන, දංබිහේන, ඇඹිලියගහ හේන | එම .. .. .. | තේ සහ පොල් | 9 | 2 | 21 |
| 351 | දික්කකුනේසගහවත්ත, බයි කකුනේගහවත්ත | (1) බලංගොඩ පරණපාරේ නො. 39යේ ගෙදර පදිංචි සන්දනම් ලිලිංනහිමියා, ඇල්ලෙපොල පදිංචි (2) මුත්තයියා නාඩාර් වෙලායුතන් නාඩාර්, (3) එම අරුමුගම් නඩාර්, (4) එම අරුනාචලම් නාඩාර් සහ (5) එම ලෙච්චමි නඩච්චි විසින් හිසමුදල් ගෙවානැත | තේ .. | 2 | 0 | 32 |
| 352 | බෙම්මේරියාබහේන .. | බලන්ගොඩ පරණපාරේ නො. 39යේ ගෙයි පදිංචි යාසු දියන්නෙහිමියා අරුලානන්දම් විසින් හිසමුදල් ගෙවානැත | හේන .. | 0 | 2 | 15 |
| 353 | එම .. | බලන්ගොඩ පදිංචි ඇග්නස් ඇලන් ජින්ජර් විසින් හිස මුදල් ගෙවානැත | එම .. | 0 | 3 | 10 |
| 354 | එම .. | එම .. .. .. | එම .. | 0 | 1 | 10 |
| 360 | අරුත්ගෙවඋඩහේනවත්ත, ගල්කොරටුවහේන | එම .. .. .. | එම .. | 1 | 0 | 0 |

* බදුදිමට පමණයි.

නක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

වී. කුමාරසාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

No. 12,652, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1938ක්වූ ජනවාරි මස 20වෙනි දිනවූ බ්‍රහස්පතින්ද පෙරවරු 9ට බලංගොඩ උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරළේ කෙලඋඩපත්තුවේ කොඩාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 301. ගම—බෝවත්ත.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | ඔහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 236 | ඉදිංකොල්ල .. | (1) පණ්ඩිතපරාක්‍රමමුදියන්සේලාගේ පියදස, (2) එම ජිනදස | හේන .. | 0 | 2 | 22 |
| 295 | තල්ගස්වත්තේහේන්යාය, ගල්ගොඩහේන | බෝවත්තේ පදිංචි වටවල විදානෙලාගේ සිංගිරි මහත්මයා ගන්ආරච්චි සහ පරණගමඇතිගේ සන්තාහාමි විසින් හිස මුදල් ගෙවානැත | එම .. | 0 | 1 | 15 |
| 299 | එම | එම .. .. .. | හේන යනාදිය | 1 | 2 | 39 |
| 354 | කලුගල්ගොඩ .. | රන්ජල්ලාගේ මුහන්දිරමලාගේ කිරිඅප්පුහාමි විසින් හිසමුදල් ගෙවා නැත | එම .. | 0 | 2 | 2 |
| 396 | බකලවත්තේහේන .. | ආණ්ඩුව .. .. | හේන .. | 1 | 2 | 28 |
| 398 | අරුත්ගෙදරවත්තේහේන | (1) බෝවිත්තේතිත්තරගේ වාසනා නයිදේ, (2) එම වාසනා හිංකොංගලාස්හාමි | එම .. | 4 | 0 | 13 |

නක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

වී. කුමාරසාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

No. 12,653, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1938ක්වූ ජනවාරි මස 20වෙනි දිනවූ බ්‍රහස්පතින්ද පෙරවරු 9ට බලංගොඩ උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරළේ කෙලඋඩපත්තුවේ කොඩාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 294. ගම—මාවෙල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | ඔහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 23J | කිරිමඩුපොලහේන ඒදන් ඔමන්කඩහේන | එදිරියනලාගේ මොහොට්ටිහාමි සහ (2) එම රත්රන්හාමි විසින් හිසමුදල් ගෙවානැත | හේන .. | 1 | 3 | 7 |
| 28B | එම .. | එම .. .. .. | එම .. | 1 | 0 | 5 |
| 40D | මරන්කැටියේහේන .. | මාවෙල පදිංචි මහමාලගේ පුංචිබබා, (2) පනාමේ පදිංචි එම කිරිපෙත්තා, (3) මාවෙල පදිංචි එම කිරිසන්තා, (4) බෝඹුව පදිංචි එම තොත්තා, (5) වැලිගෙවල පදිංචි එම කිරිබබී සහ (6) මාවෙල පදිංචි එම කිරිබින්දු විසින් හිස මුදල් ගෙවානැත | එම .. | 1 | 2 | 3 |
| 41C | මරන්කැටියේමුකලාන .. | එම .. .. .. | මුකලාන .. | 1 | 0 | 7 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 79E | අඹේගිනගේහේන්යාය, කිරිමැටියේහේන | වෙලන්ගේ පදිංචි මාවෙලවිදානෙලාගේ මොහොට්ටිහාමිගේ උරුමක්කාරයෝ:–එනම්, (1) අටකලන්කෝරලේ දිඹුලගල පදිංචි ඇම්. වී. තිලකරත්නහාමි, (2) මාවෙල පදිංචි මාරගොඩආරච්චිලාගේ සිරිවඩ්නහාමි, (3) එම ගම පදිංචි එමගේ චාසනාහාමි, (4) එම ගම පදිංචි එමගේ හුරතල්හාමි, (5) එම ගම පදිංචි එමගේ සවුමිමහාමි, (6) එම ගම පදිංචි එමගේ සිරිබෝහාමි, (7) වෙලන්ගේ පදිංචි මාවෙලවිදානෙලාගේ සින්ඤෝනිකා, (8) දිවුලගල පදිංචි එම යසෝහාමි, (9) එම හුරතල්හාමි | හේන | .. 2 0 8 |
| 83F | දෙහගම්රාලගේහේන්යාය | වලකඩමූහන්දිරමලාගේ පුංචිමහත්මයා විසින් හිඟමුදල් ගෙවානැත | එම | .. 1 0 2 |
| 83U | වාහුසිංගේවත්තේහේන | (1) මාවෙල පදිංචි වීරසේකරමුදියන්සෙලාගේ පුංචිමහත්මයා, (2) වෙලන්ගින්නේ පදිංචි එම රන්මැණිකා, (3) මාවෙල පදිංචි එම පුංචිමැණිකා, (4) රත්නපුරේ දේවාලේගාව පදිංචි එම යසෝහාමි, (5) මාවෙල පදිංචි එම සිංගිරිමැනිකා, (6) වෙලන්ගේ පදිංචි එම සින්ඤෝනිකා, (7) මාවෙල පදිංචි එම හුරතල්හාමි සහ (8) මාවෙල පදිංචි එම පියදාස විසින් හිඟමුදල් ගෙවානැත | එම | .. 5 0 13 |
| 139M | පන්නරේලහේන, කින ගහතැන්නේහේන්යාය | තොටගේ දියෝනිස් .. .. .. | හේන | .. 3 0 0 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරිතුමාගෙන්ද, ඒවාගේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

වී. කුමාරසාමි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වහන්සේ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්‍යකට, ඒනම්:—මැදමුල්ලේ සොහොන්ගුමිය විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමෙති කාණ්ඩයේ කරතිබෙන පංතාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට කිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 785. ගම—බොරකඩවත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ජම්බුගොඩැල්ල | අවුරුදු 25ක් වයස පොල්ගස් 47ක්ද, අවුරුදු 10ක් වයස පුවක්ගස් 2ක් සහ තාවකාලික ලිදකින් යුත් පොල්ඉඩම | ඇම්. ඉස්ටිවන් පෙරේරා සහ ඇම්. ජෝසප් පෙරේරා, දෙදෙනම මිනුවන්ගොඩ | 0 2 5·8 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහැකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 16වෙනි දින පෙරවරු 10යේ කාහිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමින ඒ ඉඩම අනුවෙ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔහැවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔහැ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කේ. වෛත්‍යනාදන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වහන්සේ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්‍යකට, ඒනම්:—කොස්පැලැන්කිස්සේ පාලම් අසල අන්තරාදයක වංගුව පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමෙති කාණ්ඩයේ කරතිබෙන පංතාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරීතිබෙන බලය පිට කිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 20,115. ගම—කටුබැද්ද.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දෙල්ගහවත්ත, වරිපනම් නො. 3ඒ ඉඩමේ කොටසක් | අවුරුදු 13ක් වයස පොල්ගස් 3ක් සහ අවුරුදු 47ක් වයස පොල්ගහකින් යුත් පොල්ඉඩම | ඇම්. පොර්ලැන්තිනා ප්‍රනාන්දු, නො. 12, කටුබැද්ද | 0 0 3·6 |
| 2 | දෙල්ගහවත්ත, වරිපනම් නො. 4ඒ ඉඩමේ කොටසක් | අවුරුදු 37ක් වයස පොල්ගහකද, අවුරුදු 15ක් වයස පුවක්ගස් 3ක් සහ වෙළන්දාම් කරන ලද උළුසෙවිලි ගෙයකින් යුත් ඉඩම | ජී. ඒ. ප්‍රනාන්දු, සැන්ට් හෙලන්ස්, කොන්වැන්ට් පාර, මොරටුව | 0 0 7·4 |
| 4 | එම .. | අවුරුදු 15ක් වයස පුවක්ගස් 9කින් යුත් ඉඩම | එම | .. 0 0 2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහැකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 20වෙනි දින පෙරවරු 11යේ කාහිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ ඉඩම අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔහැවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔහැ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වහන්සේ.

මේ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ අවශ්‍යත්තකට, එනම්:—නුවර-හාරගම-කුරුදුඹිය මහපාරට පස් කඩාවැටීම වැලකීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "මේ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 461. ගම—නාපටවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මුලත්වත්තේ අස්වැද්දුම | කුඹුර | නාපටවෙල පදිංචි සිරිවර්දනගේ කරනේලිස් | 0 0 23·8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1937ක්වූ දෙසැම්බර් මස 10වෙනි දින උදේ දහයට පදියපැලැල්ලේ ගම්සභාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

මේ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින නුවරඑළියේ කච්චේරියේදීය.

ආර්. ඇම්. ඩේවිස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වශයෙන්.

---

මේ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ අවශ්‍යත්තකට, එනම්:—කරන්දොට ගැහැණු පාඨශාලාවේ වත්ත ලොකුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "මේ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

අවසාන ගම් සිතියමේ නො. 590, අතිරේක 6. ගම—කරන්දොට.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 39 | දුන්වත්ත | අවුරුදු 15–25 පමණ වයස ඇති කිතුල් ගස් 7ක්ද, පුවක්ගස් 1ක්ද, අඹගහක්ද ඇති වත්ත | හක්මනේ කරන්දොට පදිංචි ඩී. එච්. වික්‍රමවිචි මොහොට්ටාල, ජේ. ඒ. දෙන් ක්‍රිස්තිනාහාමිනේ, ඩබ්ලිව්. ජේ. දෙන් අන්දිරිස්, ගුණරත්න බබාහාමිනේ, වදනම් බිංගේ සිත්තිහාමි සහ සිංගහෙවිටිගේ හින්හාමි | 0 0 9·4 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1937ක්වූ දෙසැම්බර් මස 20වෙනි දින පෙරවරු 9.30 කාලයමට හක්මන නානායකමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

මේ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින මාතර කච්චේරියේදීය.

ඇස්. බී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වශයෙන්.

---

මේ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ අවශ්‍යත්තකට, එනම්: දේවාලේගම යන ගමේ ආණ්ඩුවේ පෝෂිත පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "මේ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

අවසාන ගම් සිතියමේ නො. 165, අතිරේක 3. ගම—දේවාලේගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 80 | කිරගහහේන | අවුරුදු 30ක් වයස ඇති කොස්ගහක්ද, අවුරුද්දට බාල පොල්පැල 9ක්ද, අවුරුදු 5–10 වයස ඇති පුවක්ගස් 8ක්ද, දෙල්ගහක්ද, අවුරුදු 10ක් වයස ඇති පුලුන්ගහක්ද, අවුරුද්දක් වයස ඇති දෙහිපැල 2ක්ද, මුරුන්ගගස් 7ක්ද, තාවකාලික ස්කෝල ගොඩනැගිල්ලක්ද, කුස්සියක් සහ කක්කුස්සියක්ද ඇති වත්ත | හක්මනේ, කිහම්බියේ, රදවල පදිංචි දෙන් අල්විස් මුණසිංහ | 1 0 10·8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1937ක්වූ දෙසැම්බර් මස 20වෙනි දින පෙරවරු 9.45යේ කාලයමට හක්මන නානායකමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින මාතර කච්චේරියේදීය.

ඇස්. බී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වශයෙන්.

---

මේ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ අවශ්‍යත්තකට, එනම්:—වලහනදුනේ යන ගමේ ප්‍රසිද්ධ ළිඳක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "මේ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

අවසාන ගම් සිතියමේ නො. 560, අතිරේක B. ගම—වලහනදුනේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 328 | ගල්කඹුරුවිහේන හෝ හොත් ළිඳගාවහේන | අවුරුදු 8ක් වයස ඇති පොල්ගස් 1ක්ද, පුවක්ගස් 1ක්ද සහ බඳුමෙන් බැඳපු ළිඳක්ද ඇති වත්ත | වලහනදුනේ පදිංචි කේ. ජී. දෙන් ඩේවිඩ් සහ කේ. ජී. දෙන් කිමාරු | 0 0 3 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1937ක්වූ දෙසැම්බර් මස 21වෙනි දින පෙරවරු 10යේ කාලයමට අකුරැස්සේ නානායකමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

මේ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින මාතර කච්චේරියේදීය.

ඇස්. බී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වශයෙන්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කොතාවල යන ගමේ ප්‍රසිද්ධ ලිඳක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 578. ගම—පරඹාහැර.

| නො. | ඉඩමේ නම. | ඇතුම්. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කුරුඳුවත්ත .. | බිඳුමෙන් බැඳපූලිඳක් ඇති පොල් වත් තෙන් කොටසක් | කැකනදුරේ හාඹටුන්ගේ පදිංචි හේවමද්දුමලියනගෙයි දෙන් හෙන්දික්, හේවාමද්දුමලියනගෙයි දෙන් සියදෝරිස්, හේවාමද්දුමලියනගෙයි ජීනදාස, කැකනදුරේ පරඹාහැර පදිංචි ඉඳුරුවේගෙයි ලොකු සිසිලියානා, අංබිම්බුම, ඉඳුරුවේගෙයි දෙන් ජුවානිස්, ඉඳුරුවේගෙයි දෙන් දියෝනිස්, ඉඳුරුවේගෙයි දෙන් අල්ලිස්, ඉඳුරුවේගෙයි සිද්දුමහාමි, කැකනදුරේ උඩ අප රුක්ගාන පදිංචි හේවාහල්පේගෙයි බාලහාමි සහ හේවා බැද්දේගෙයි පිරිස්අප්පු | 0 0 2·09 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ සැලසුනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර් 1937ක්වූ දෙසැම්බර් මස 21වෙනි දින පස්වරු 3 කනිසමට කැකනදුරේ ගම්සභාව නඩුශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ රකාශි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 12වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඇස්. බී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—යෝධවැව යටතේ ජුබිලි රෝඩ් නමින් පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ; ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,200. ගම—අලන්කුලම්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කට්ටුකානි .. | මුඩුබිම .. | උසිලන්කුම්, අලන්කුලමේ පදිංචි සූසේ ක්‍රිෂ්ණතෝගු .. | 0 0 15 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ සැලසුනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 17වෙනි දින පෙරවරු 11ගේ කනිසමට මන්නාරම් කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ රකාශි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 16වෙනි දින
මන්නාරම් කච්චේරියේදීය.

සී. ජී. ඇල්. මිසෝ,
මන්නාරම ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඇල්ලගාවා පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 218. ගම—යටිපන්නුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 514 | පොල්ගහහේන, පාරවත්ත | පාර .. | පී. ඒ. බැණීක්එතනා .. .. | 0 0 4·8 |
| 545 | පොල්ගහහේනේදෙනිය , | එම .. | එම .. .. .. | 0 0 3·5 |
| 546 | දන්කනත්තේහේන .. | එම .. | එම .. .. .. | 0 0 4·1 |
| 547 | පොල්ගහහේනේවත්ත .. | එම .. | එම .. .. .. | 0 0 5·5 |
| 548 | දන්කනත්තේහේන .. | එම .. | එම .. .. .. | 0 0 3·2 |
| 549 | එම .. | ලන්ද .. | එම .. .. .. | 1 0 22·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ සැලසුනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් ලියවිල්ලකින් බලය ඇතුව තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 13වෙනි දින උදේ 10ගේ කනිසමට කිරිඇල්ලේ ගම්සභාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ රකාශි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. රොබිස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අල්පිටියේ ගමේ සොහොන්භූමියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 602. ගම—නියම්බරවත්ත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 83 | හැටපොල්හේන, වාෂ් පුරේහේන | ලන්ද .. | ඇස්. ඒ. අයි. ඇලපාත මහතා සහ වකුම්පුරගේ කිරිපෙත්තා | 1 0 0 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ සැලසුනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් ලියවිල්ලකින් බලය ඇතුව තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 15වෙනි දින උදේ 10ගේ කනිසමට මාදම්පේ නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ රකාශි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. රොබිස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 773

### මරදානේ අළුත් තැපැල් කන්තෝරුව සඳහා ගත් ඉඩම බදුදීම.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව වර්ෂ 1938ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් මාස හයකට මරදානේ අළුත් තැපැල් කන්තෝරුව සඳහා ගත් ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහ ගස්වල බද්ද මිලයට ගැනීම පිණිස සීල් තබා එවනුලබන ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර පළාතේ දිසාපතිතුමා විසින් බාරගන්නවා ඇත.

2. එකී ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 3වෙනි සිකුරාදා දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී බාරගන්න එම වෙලාවට කඩාබලනු ලැබේ.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර එවන්නාවූ සියලු දෙනාම එම ඉල්ලුම්පත්‍ර සැබෑවූ ඒවා බව දිසාපතිතුමාට ඒත්තුගැනීම පිණිස තමන් හෝ තමන් වෙනුවෙන් ඊට නිසි බලයක්ලත් අයෙක් එම වෙලාවට පෙණීසිටින්ට ඕනෑය.

4 වැඩි විස්තර කොළඹ කච්චේරියේදී ඉල්ලා බලාගත හැක.

ඩබ්ලිව්. ඊ. හොබ්ඩේ,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 19වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

#### කොන්දේසි.

1. මිලයටගන්නා අය සම්පූර්ණ බදුමුදල වෙන්දේසි දවසේ දීම ගෙවිය යුතුයි.

2. මිලයටගත් අයට ඉඩමේ ඵලප්‍රයෝජන ගැනීමේ හා එහි ගොඩනැගිලි තිබේනම් ඒවායේ පදිංචිවීමේ අයිතිය තිබේවි.

3. මිලයටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් විසින් හෝ කිසිම ගහක් කැපීම, වැටක් ගිනිසිමක්, හෝ ගොඩනැගිල්ලක වෙනසක්කිරීම තහනම්ය.

4. දිසාපතිතුමා විසින් ඉල්ලීමක්කළ විටකදී මිලයටගත් අය වැටවල් බැඳීමට බැඳී සිටියි.

5. මිලයටගත් අය විසින් එම ඉඩම යහපත්ලෙස පිරිසිදුව තබාගැනීමද, සෑම අයබදුම ගෙවීමද, නාගරික සභාවේ අණපණත්වලට එකගව ක්‍රියාකිරීමද කළයුතුයි.

6. දිසාපතිතුමාට හෝ එතුමාගේ බලයපිට ක්‍රියාකරණ කෙනෙකුට බදුකාරයාට මාසයක් කල්දීමෙන් වන්දියක් නොගෙවා උවමනා ප්‍රස්ථාවකදී ආපසු ගතහැක.

7. බස්නාහිර පළාතේ දිසාපතිතුමාගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව මිලයටගත් අය විසින් එකී ඉඩමේ හෝ ගොඩනැගිලිවල බද්ද වෙන කෙනෙකුට පැවරීම, විකිණීම හෝ දෙවන බද්දක් දීම තහනම්ය.

8. මිලයටගත් අය විසින් පොල්ගස් රා හෝ තෙලිජ්ජ ගැනීම සඳහා මැදීමට ඉඩදීම තහනම්ය.

9. බද්ද අවසානවන්ට ප්‍රථම එම ඉඩම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආණ්ඩුවට උවමනා කළහොත් මාසයක් කල් ඇතුව දැන්වීමක් කළවිට එය වන්දි නොසිල්වා ආණ්ඩුවට භාරදිය යුතුයි. ආණ්ඩුව විසින් බුක්තිය භාරගනුලැබූ ඉඩම් කොටසේ හෝ සම්පූර්ණ ඉඩමේ ඉතිරි බදුකාලයට වැටයෙන බදුමුදල නැවත මිලයටගත් අයට ගෙවනවා ඇත.

10. මිලයටගත් අය දිසාපතිතුමාට හෝ එතුමාගේ නියමය පිට පැමිණෙන කෙනෙකුට ඉඩම පරීක්ෂාකිරීම සඳහා සුදුසු වේලාවලදී ඊට ඇතුල්වීමට ඉඩහැරිය යුතුයි.

11. ඉඩමේ දැනට තිබෙන ලකුණු කණු, අගල් කානුවල පියන් ආදිය අස්කිරීමක් හෝ වෙනස්කිරීමක් නොකිරීමට මිලයටගත් අය වගබලාගත යුතුයි.

12. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව කිසිම ගොඩනැගිල්ලක්, මඩුවක්, හෝ කෝපි කඩයක් ඇතිකරන්ට තහනම්ය.

13. ඉහතකී කොන්දේසි කඩකළොත් එම ඉඩමේ බුක්තිය භාරගෙන මිලයටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් එයින් අස්කිරීමට දිසාපතිතුමාට බලය තිබේ.

14. එක ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට දිසාපතිතුමාට බලය තිබේ.

#### ඉඩමේ තොරතුරු.

නො. 19,924 දරණ ප්ලෑනේ පෙන්නුම්කරණ මරදානේ අළුත් තැපැල් කන්තෝරුව සඳහා ගත් පොල්ගස් 18ක්, කොස්ගස් 2ක්, පේරගස් 3ක්, සහ කාලික ගොඩනැගිලි 3ක් ඇති ඉඩම වේ.

---

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් කෑගල්ල දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පෙරවරු 11 පැය පටන් නුවර තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑ වත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ආර්. ඇස්. වී. පෝලියර්,
ස. දි. පිස්කල් වරයා.

වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 13වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

---

## අන්‍ය දැන්වීමයි.

මාතර කඩවත්සතර ඇළ ගොඩගම පදිංචි විදනගමගේ භාරතීසිංහ අප්පු වන මම මෙවක් පටන් තුන්මසකින් මාතලේ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩකරණ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරණු ලැබීම සඳහා කොළඹ රිජිස්ට්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලුම්කිරීමට අදහස්කර සිටින බව මෙයින් දැනුම්දෙමි.

V. B. Epa.

වර්ෂ 1937ක්වූ මැයි මස 30වෙනි
දින මාතරදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.